# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 15 දරන
# විදුලිබල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 අප්‍රේල් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 60 යි  තැපැල් ගාස්තුව: ශත 60 යි

## 1984 අංක 15 දරන විදුලිබල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 24 වන දින.]

එල්. ඩී.—ඕ. 40/83

**විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1984 අංක 15 දරන විදුලිබල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) විදුලිබල පනතේ 65 වන වගන්තියෙහි ඇති "රුපියල් පන් සියයකට නොවැඩි" යන වචනවල සිට "වරදකට වරදකරු විය යුතු ය." යන වචන දක්වා ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — 205 වන අධිකාරයේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම.

"වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය ; තව ද වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ දඬුවම නියම කිරීමට ඒ අධිකරණයට මෙයින් බලය පවරනු ලැබේ.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියෙහි ඇති "රුපියල් පන්සියයකට නොවැඩි" යන වචනවල සිට "වරදකට වරදකරු විය යුතු ය." යන වචන දක්වා ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— — ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

"වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය ; තවද වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද ඒ දඬුවම නියම කිරීමට ඒ අධිකරණයට මෙයින් බලය පවරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියෙහි ඇති "රුපියල් පන්සියයකට නොවැඩි" යන වචනවල සිට "වරදකට වරදකරු විය යුතු ය." යන වචන දක්වා ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වරදකරු කිරීමේ දී රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය; තව ද වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ දඬුවම නියම කිරීමට ඒ අධිකරණයට මෙයින් බලය පවරනු ලැබේ.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 67අ, 67ආ සහ 67ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ, 67ආ සහ 67ඇ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය:—

"65 වන, 66 වන හෝ 67 වන වගන්ති යටතේ වූ වැරදිවලට අනුබල දීම වරදක් බව.

67අ. 65 වන වගන්තිය, 66 වන වගන්තිය හෝ 67 වන වගන්තිය යටතේ දඬුවම් දිය හැකි වූ යම් වරදක් සිදු කිරීමට අනුබල දෙන කවර වූ හෝ තැනැත්තකු ඒ වරදට වරදකරු විය යුතු අතර ඒ සඳහා විධිවිධාන සලස්වා ඇති දඬුවමට යටත් විය යුතු ය.

මේ වගන්තියෙහි "අනුබල දීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයෙහි 100 වන වගන්තියේ සහ 101 වන වගන්තියේ ඇති අර්ථයම ඇත්තේ ය.

65 වන, 66 වන හෝ 67 වන වගන්ති යටතේ වූ සෑම වරදක් ම සංඥෙය වරදක් හා ඇප දිය නොහැකි වරදක් විය යුතු බව.

67ආ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, 65 වන වගන්තිය, 66 වන වගන්තිය හෝ 67 වන වගන්තිය යටතේ වූ සෑම වරදක් ම, ඒ පනතේ අර්ථානුකූල ව සහ ඒ පනතේ කාර්ය සඳහා—

(අ) සංඥෙය වරදක් විය යුතු ය; තව ද

(ආ) ඇප දිය නොහැකි වරදක් විය යුතුය.

67ඇ. (1) 65 වන වගන්තිය, 66 වන වගන්තිය හෝ 67 වන වගන්තිය යටතේ වූ යම් වරදකට, යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට මහෙස්ත්‍රාත් අධිකරණය විසින් මේ පනත යටතේ නියම කරනු ලැබීමට නියමිත යම් දණ්ඩනයකට අතිරේකව, ඒ වරද සංයුක්ත වන ක්‍රියාවේ හෝ පැහැර හැරීමේ හෝ ප්‍රතිඵලයක් වශයෙන් බලපත්‍රලාභියාට සිදුවන අලාභයේ හෝ හානියේ වටිනාකමට සමාන මුදල් ප්‍රමාණයක වූ දඩයක් ඒ තැනැත්තා වෙත නියම කරනු ලැබිය යුතු ය. එවැනි අතිරේක දඩයක් ලෙස අයකර ගනු ලබන යම් මුදලක් බලපත්‍රලාභියා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට එම බලපත්‍රලාභියා වෙත ගෙවනු ලැබිය යුතුය.

(2) තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් ප්‍රධානයා ලෙස හෝ අනුබල දෙන්නා ලෙස හෝ එකම වරද සිදුකර, වරදකරු කරනු ලැබූ අවස්ථාවක දී, එම හානියේ හෝ අලාභයේ වටිනාකම එම තැනැත්තන් අතර කොටස් කර බෙදිය හැකි අතර එසේ කොටස් කර බෙදූ මුදල් ප්‍රමාණය ඒ තැනැත්තන් අතුරින් එක් එක් තැනැත්තා වෙත දඩයක් ලෙස නියම කරනු ලැබිය යුතුය.

(3) බලපත්‍රලාභියා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක්, පටහැනිව සාක්ෂි නොමැති අවස්ථාවක දී, ඒ අලාභයේ හෝ හානියේ වටිනාකම පිළිබඳව සාධකයක් ලෙස භාර ගනු ලැබිය යුතු ය.''.

65 වන, 66 වන හෝ 67 වන වගන්ති යටතේ සෑම වරදක් සඳහා ම අතිරේක දඩයක් නියම කරනු ලැබිය යුතු අතර, පටහැනිව සාක්ෂි නොමැති අවස්ථාවක බලපත්‍රලාභියා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් ඒ අලාභයේ හෝ හානියේ වටිනාකම **පිළිබඳව** සාධකයක් විය යුතු බව.